# මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සහ මානව සම්පත් කළමනාකරණ සම්මාන

මානව සම්පත් වෘත්තිකයෝ (HRP) යනුවෙන් සමාන්‍යයෙන් හඳුන්වනු ලබන මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය වසර 2000 දී ආරම්භ කරන ලද්දේ " මානව සම්පත ප්‍රමුඛස්ථානයට ගැනීමේ" මහැඟි අරමුණ ඇතිවයි. එය බිහිවූයේ මානව සම්පත් කළමනාකරණ වෘත්තිකයන් එකිනෙකා මුණගැසීමට අවස්ථාවක් ඇති කරගැනීමට, එකිනෙකාට උපකාර කරගැනීමට , දැනුම, අත්දැකීම් හුවමාරු කරගැනීම සහ, වඩාත් වැදගත් කරුණක් වශයෙන් අනෙකුත් වෘත්තීන්ට ලැබී තිබෙන ආකාරයේ නිසි පිළිගැනීමක් සහ අනුමැතියක් ද ලබාගැනීමේ අවශ්‍යතාවය මතය.

ගතවුණු වසර දොළහක කාලය මානව සම්පත් වෘත්තිකයන් හට ජයග්‍රාහී අත්දැකීමක් වී තිබේ. තම කටයුතු ආරම්භ කර ගෙවුණු දොළොස් වසර තුළ මානව සම්පත් වෘත්තිකයන් විසින් අත්කරගෙන තිබෙන ප්‍රතිඵල අද්විතීය වේ. තමන්ට පමණක් නොව, තමන් සේවය කරන ආයතනයන්ට ද ප්‍රතිලාභ අත්කර දෙමින් උපකාර, මඟපෙන්වීම් සහ සහාය ලබාගැනීම සඳහා අනෙකුත් සාමාජිකයන්ගේ සහයෝගය ලබාගැනීමට හැකි වීම මේසා විශිෂ්ට ප්‍රතිඵලයකට හේතු වී ඇත.

IPMA-HR සමග සහයෝගීව කටයුතු කිරීම තුළින්, මානව සම්පත් වෘත්තිකයන් විසින් සහතික කිරීමේ වැඩසහනක් පවත්වාගෙන යනු ලබන අතර ඊට සාර්ථකව සහභාගී වූ අයට ලොව පිළිගත් මානව සම්පත් කටයුතු පිළිබඳ පිළිගැනීමක් අත්කර දී තිබේ.

කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය සමග අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කර තිබෙන මානව සම්පත් වෘත්තිකයන්, එහි ශිෂ්‍යයන්ට විෂ්‍ය කරුණුවලින් ඔබ්බට ගිය ආචාරශීලී පිළිවෙත්, සන්නිවේදනය, වෘත්තීය කරුණු, චර්යා රටා වැනි විෂය ක්ෂේත්‍රයන්ට දැනුම අවබෝධය ලබාදෙමින්, එකී සෑම විෂයකටම ලකුණු ලබාදෙන වැඩි දුර පාඨමාලාවන් දෙකක් ද පවත්වනු ලබයි. මෙම අධ්‍යයනයන් හරහා රැකියාවන් සඳහා වූ තම අපේක්ෂාවන්ට වටිනාකමක් ලැබෙන බවට උපාධි අපේක්ෂකයන් විසින් අවබෝධ කරගෙන තිබීම නිසා මේ පිළිබඳව ඔවුන් අතිශයින් ආකර්ෂණය වී තිබේ.

දේශීය වශයෙන් හා කලාපීය වශයෙන් මානව සම්පත් වෘත්තීය ඉහළ තලයකට ගෙන ඒම සඳහා මානව සම්පත් වෘත්තිකයන් ඉන්දියාවේ මානව සම්පත් කළමනාකරණ සංගමය (SHRM) සමග ද අවබෝධතා ගිවිසුමක් පසුගිය වසරේදී අත්සන් කරන ලදී. අපගේ සහයෝගීතාවයේ කොටසක් වශයෙන් මානව සම්පත් ප්‍රජාවගේ දැනුම් ජාලය සඳහා පහසුකම් සැපයීමත්, මානව සම්පත් හැකියාවන් වර්ධනය කිරීම සඳහාත් මානව සම්පත් කළමනාකරණ සංගමය (SHRM) සහ මානව සම්පත් වෘත්තිකයන් කටයුතු කරනු ඇත.

2003 වසරේදී ජාතික මානව සම්පත් කළමනාකරණ සම්මාන ක්‍රමවේදයක් මානව සම්පත් වෘත්තිකයන් විසින් නිර්මාණය කර පුළුල් දැක්මකින් යුතුව ක්‍රියාත්මක කරන ලද්දේ ශ්‍රී ලංකාව තුළ මානව සම්පත් කළමනාකරණයේ තත්ත්වය වැඩිදියුණු කිරීම යථාර්තයක් කිරීම සඳහාය. එම පුළුල් දැක්මෙ හි ප්‍රථම පියවර ලෙස පළමුවැනි ජාතික සම්මාන ප්‍රදාන උළෙල එම වසරේදීම හඳුන්වාදෙනු ලැබිණි.

එදා සිට මේ දක්වා සම්මාන ප්‍රදාන උත්සව තුනක් පවත්වා තිබෙන අතර අවසන් සම්මාන ප්‍රදානය 2010 දී පැවැත්විණි. සෑම වසරක් පාසාම, ජයග්‍රාහකයන්ට සම්මාන ප්‍රදානය කිරීමේ උළෙලක් පමණක් නොව, සහභාගී වූ ආයතනයන් හි මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලි සහ ක්‍රමවේදයන් ද ඇගයීමේ ක්‍රියාවලියේද වර්ධනයක් ඇති කරමින් මෙය, පියවරෙන් පියවර අති සාර්ථක වර්ධනයක් කරා රැගෙන යෑම අරමුණ විය.

එකල හුවිට් (Hewitt) යනුවෙන් හඳුන්වනු ලැබූ ආයතනය සමග 2007 වර්ෂයේදී මානව සම්පත් වෘත්තිකයන් හවුලක් ඇතිකරගත් අතර සම්මාන ප්‍රදානයට ඇතුළත් වූ ආයතනවල දත්තයන් එක්රැස් කිරීම සහ ඒවා ඇගයීම ඊට පැවරීම මගින් සහභාගී වූ ආයතන පිළිබඳ තොරතුරු මානව සම්පත් වෘත්තිකයින්ට දැනගැනීමට හෝ එයට සම්බන්ධ වීමට අවස්ථාවක් නොලැබිණි. මෙම තත්ත්වය, ව්‍යාපාර ප්‍රජාව විසින් මනාව පිළිගැනීමට ලක් කළ අතර සහභාගීත්වයද වසරින් වසරට වර්ධනය වීමක් පෙන්නුම් කෙරිණි.

මේ වන විට හුවිට් ආයතනය AON හුවිට් ඇසෝසියේට්ස් වශයෙන් හැඳින්වෙන අතර මානව සම්පත් උපදේශනයේ සහ සැපයීමේ ගෝලීය ප්‍රමුඛයා ද වේ. නොයෙකුත් ආයතනවල සංකීර්ණ ප්‍රතිලාභ, නිපුණතා සහ අදාල මූල්‍ය අභියෝගයන් විසඳා ගැනීම සඳහා ඔවුන් සහයෝගය දක්වයි. මානව සම්පත් වෘත්තිකයින්ගේ ආරාධනයට අනුව 2012 මානව සම්පත් සම්මාන උළෙලේ කටයුතු වෙනුවෙන් AON හුවිට් නැවතත් වරක් තම තෘප්තිමත් දායකත්වය සපයා තිබේ. බොහෝ ස්ථානයන් හි තිබෙන බොහෝ කර්මාන්තයන් පිළිබඳව මානව සම්පත් ක්ෂේත්‍රයේ පුළුල් මෙන්ම ගැඹුරු වූ ද විශේෂඥතාවන් සහ සේවාවන් සහිත ශක්තිමත් වෘත්තිකයන් කණ්ඩායමක් අනෙකුත් මානව සම්පත් උපදේශන ආයතනයන්ට වඩා වැඩියෙන් AON හුවිට් සතුවේ. ඔවුන්ගේ ඒකායන ඉලක්කය පාරිභෝගිකයින් වන අතර ඔවුන් විශේෂිත වටිනාකමකින් යුතු පාරිභෝගික සේවාවක් සහ ඉහළ ව්‍යාපාර ප්‍රගතියක් ද අත්පත්කර දීමට ඇපකැප වී ක්‍රියාකරයි.

AON හුවිට් ආයතනය, රටවල් 90ක් තුළ විසිරුණු කාර්යාල 330ක් සහිතව, සේවානියුක්තිකයන් 29,000ක් සහිතව ලොව අංක 1 මානව සම්පත් උපදේශන සහ සැපයීමේ ප්‍රමුඛයා බවට පත්ව ඇත. ඔවුන්ගේ ඒකාබද්ධ වාර්ෂික ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 4.3ක් වන අතර ෆෝචූන් 500 සමාගම් 80 % කට සිය සේවාවන් සලසනු ලබයි.

මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රමුඛයන් වශයෙන් හඳුනාගත් ශ්‍රී ලාංකික විශිෂ්ඨ සමාගම් 10ක් සඳහා 2007 වසරේදී සම්මාන පිරිනැමිණි. දේශයේ විශිෂ්ටතම මානව සම්පත් කළමණාකරන ක්‍රමවේදයන් සහිත සමාගම් වැඩි ප්‍රමාණයක් ඇගයීම සඳහා 2010 වසරේ දී රන් සම්මාන 10ක් ද, රිදී සම්මාන 10ක් ද වශයෙන් සම්මාන ප්‍රමාණය පුළුල් කරන ලදී.

සාර්ථක ප්‍රතිඵල කිහිපයක් හේතුවෙන් වසර 2012 මානව සම්පත් වෘත්තිකයන්ට විශේෂ වැදගත්කමක් සහිත වේ. මේ වසරේ දී සම්මාන සඳහා වාර්තාගත ලෙස ඉල්ලුම්පත් 79ක් අප වෙත ලැබී තිබෙන අතර ජයග්‍රාහකයන් තෝරාගැනීම සඳහා තීරකයන්ට අවස්ථාව සැලසීම සඳහා සියලු වැඩ කටයුතු ඔවුන් විසින් අවසන් අදියර දක්වා සම්පූර්ණ කෙරෙමින් තිබේ.

වසර 2007 සිට තීරකයන් වශයෙන් තෝරාගනු ලැබුවේ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් හා හුවිට්, ඉන්දියාවේ සහ IPMA-HR හි ප්‍රමුඛ පෙළේ ආයතනයන් හි පිළිගත් විද්වතුන් පිරිසකි. මෙම වසර සඳහා ද ඉන් බැහැර වීමක් නොවන අතර මේ වසරේ තීරකයන් තෝරාගැනීම වඩාත් සැළකිල්ලෙන් යුතුව සිදු කරන ලදී.

සම්මාන ප්‍රදානය සඳහා අනුග්‍රාහකත්වය සැපයීමට සහ සහාය දැක්වීමට ව්‍යාපාරික ප්‍රජාවේ ගෞරවනීය සමාගම් බොහොමයක් ඉදිරිපත් වීම හේතුවෙන් මෙම වසර ද අපට විශේෂිත වූ වැදගත්කමක් සහිත වේ. 2012 වසර සඳහා අපගේ ඉතිහාසයේ පෙර නොවූ විරූ අනුග්‍රාහකත්වයක් අපට ලැබී තිබේ.

අපගේ අනුග්‍රාහකයන් සහ පහසුකම් සපයන්නන්

- ප්ලැටිනම් අනුග්‍රාහකත්වය - ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනේරු සමාගම
- ස්වර්ණ අනුග්‍රාහකත්වය - හැටන් නැෂනල් බැංකුව
- ලෝකඩ අනුග්‍රාහකත්වය - සී අයි සී සමූහ ව්‍යාපාර<br>භාරතී එයාර්ටෙල් ලංකා (පුද්ගලික) සමාගම
- ප්‍රවර්ධකයෝ - සිංගර් සමාගම<br>බ්‍රැන්ඩික්ස් සමාගම
- නිල ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකරු - DAV ටෙක්නොලජීස් (පුද්ගලික) සමාගම
- නිල තාක්ෂණික සහකරු - මයික්‍රොඉමේජ් (පුද්ගලික) සමාගම
- නිල ගුවන් සේවය - ශ්‍රී ලංකන් ගුවන් සේවය

මාධ්‍ය සහකරු - ගෝල්ඩ් එෆ්.එම්, සූරියන් එෆ්.එම්

සහ හිරු එෆ්.එම්

සහායක මුද්‍රිත මාධ්‍ය සහකරු - වීරකේසරී

නිල රූපවාහිනී නාලිකාව - ARTv

මීට අමතරව යුනිලිවර් සමාගම, බ්‍රවුන්ස් සමාගම, ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරය, සිලෝන් ටුබැකෝ සමාගම සහ කොමර්ෂල් බැංකුව යන ආයතනයන් ද අපට විවිධ ආකාරයෙන් උපකාර කරන ලදී.

මෙම වසරේ සම්මාන උළෙලේ අනෙක් විශේෂිත කරුණ වන්නේ රජ්‍ය අංශය සඳහා ද දෙරටු විවෘත කිරීමයි. රාජ්‍ය අංශය සඳහා පළමු සම්මාන අතුරින් සම්මානයක් වෙන් කර ඇති අතර සම්මාන දෙන ආකාරය ඉතා සුවිශේෂිත අයුරින් පුළුල් කර තිබේ. තම මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයන් සහ විධික්‍රමයන් වර්ධනය කරගැනීම සඳහා රාජ්‍ය අංශයේ ආයතනයන් දිරිමත් කළ යුතු බවත්, ඒ සමගම ඒවායෙහි විශේෂිත වර්ධනය සඳහා දායකත්වය සැපයූ අයවළුන්ගේ කැපවීම අගය කළ යුතු බවත් මානව සම්පත් වෘත්තිකයින්ගේ අදහස වේ.

වසර 2007 සිට සම්මාන උළෙලට අනුබද්ධව අධ්‍යයන සම්මන්ත්‍රණයක් මානව සම්පත් වෘත්තිකයන් විසින් ආරම්භ කරන ලද අතර සහභාගීවන්නන් අතර සාකච්ඡාවක් ඇති කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විෂයයන් පිළිබඳ දැනුම සහිත, කලාපයේ මෙන්ම සහභාගීවන ආයතනයන් හි මානව සම්පත් පිළිබඳ විද්වතුන් ද ඊට සහභාගී කරගන්නා ලදී. මෙය ද මනා පිළිගැනීමකට ලක්ව තිබේ. " ඇක්සියම් රිවලූෂන්" නැමති මෙම වසරේ අධ්‍යයන සම්මන්ත්‍රණය මැයි මාසයේදී පවත්වන ලදී.

2012 මානව සම්පත් කළමනාකරණ සම්මාන ප්‍රදානය, මානව සම්පත් වෘත්තිකයින්ගේ සංගමය මගින් 2012 ජූලි 31 වැනි දින ඉතා අභිමානවත් අයුරින් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පවත්වනු ලබන අතර එහිදී ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙම අභිමානවත් අවස්ථාව සැමටම, එතෙක් මෙතෙක් කිසිදා අත්නොවිඳි, අනභිබවනීය අති උත්කර්ෂවත් අත්දැකීමක් වනවා නොඅනුමානය.